# ඔවුන් ඔබට පැවසීමට කැමති ශුභාරංචිය

යේසුස් මිහිපිට සිටි විට ඔහුගේ ගෝලයෝ ඔහු වෙතට පැමිණ මෙසේ ඇසුවෝය. “ඔබේ පැමිණ සිටීමටද සමාජ ක්‍රමයේ අවසාන කාල පරිච්ඡේදයටද ලකුණ කුමක්ද?” ඔහු මීට පිළිතුරු දෙමින් කියා සිටියේ ජාතීන් බොහොමයක් හවුල් වන යුද්ධ, සාගත, වසංගත, භූමිකම්පා, නීති විරෝධී ක්‍රියා වැඩිවීම, බොරු ආගමික ගුරුවරුන් බොහෝදෙනෙකුව මුළා කිරීම, සිය සැබෑ අනුගාමිකයන් කෙරෙහි වෛරයකින් ඔවුන්ට පීඩා කරනු ලැබීම සහ බොහෝදෙනෙකු තුළ ධර්මිෂ්ඨකම කෙරෙහි ඇති ප්‍රේමය හීනවීම යනාදිය තිබෙනු ඇති බවයි. මෙම දේවල් සිදු වෙන්නට පටන්ගන්නා කල, ඉන් ඇඟවෙන්නේ ක්‍රිස්තුස් අදෘශ්‍යමානව පැමිණ සිටින බවත්, ස්වර්ගික රාජ්‍යය ළඟ බවත්ය. මෙය ඇත්තටම ශුභාරංචියක් වනු ඇත! මෙබැවින්, මෙම ලකුණේ කොටසක් හැටියට යේසුස් මේ වචනද ඊට එකතු කළේය. “රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස මුළු ජනාවාස පොළොව පුරාම දේශනා කරනු ලබන්නේය. එවිට අවසානය පැමිණෙන්නේය.”—මතෙව් 24:3-14.

මෑතකදී ලොවේ සිදු වූ දේවල් දෙස බැලූ කල, ඒවා නරක දේවල් බව ඇත්තය. එහෙත් ඒවායින් හුවා දක්වන කාරණය යහපත්ය. එනම් ක්‍රිස්තුස්ගේ පැමිණ සිටීමය. මෙහි ඉහත සඳහන් කර ඇති තත්වයන් සිදුවීමට පටන්ගත්තේ 1914දීයි! එම වසර ඉතා පුළුල් ලෙස සනිටුහන් වුණු වසරකි. යුදෙව් නොවන්නන්ගේ කාලවල නිමාව ඒ මගින් සලකුණු වූ අතර, එය මිනිසුන් විසින් පොළොව පාලනය කරනු ලැබූ කාල පරිච්ඡේදයක් අවසන් වී ක්‍රිස්තුස්ගේ දහස් අවුරුදු (සහස්‍ර) පාලන කාලයට සංක්‍රමණය වීමේ ආරම්භයක්ද විය.

පාලනයන් මාරුවීමට අතරමැදි කාලයක් තිබෙනු ඇති බවට ඇඟවීමක් ගීතාවලිය 110වන පරිච්ඡේදයේ 1 සහ 2වන පදවලද එළිදරව් 12:7-12දක්වාද දක්නට තිබෙයි. මෙහිදී පෙන්වනු ලබන්නේ ක්‍රිස්තුස් රජ වන තෙක් ස්වර්ගයේ දෙවිගේ දකුණු පැත්තේ අසුන්ගන්නා බවයි. අනතුරුව ඇති වන යුද්ධයේ ප්‍රතිඵල වන්නේ සාතන්ව පොළොවට හෙළනු ලැබීමත්, ඒ නිසා පොළොවට දුක් පැමිණීමත් ක්‍රිස්තුස් තමන්ගේ සතුරන් මැද ආණ්ඩු කිරීමත්ය. දුෂ්ටකමේ සම්පූර්ණ අවසානය “මහත් පීඩාවක්” මගින් පැමිණෙන අතර, හර්මගෙදොන් යුද්ධයෙන් එය නිමාවට පත් වේ. ඉන් අනතුරුව එළඹෙන්නේ ක්‍රිස්තුස්ගේ සාමයේ දහස් අවුරුදු පාලනයයි. —මතෙව් 24:21, 33, 34; එළිදරව් 16:14-16.

බයිබලය මෙසේ කියයි. “නමුත් අන්තිම දවස්වලදී කටයුතු කිරීමට අසීරු, අන්තරාදායක කාලවල් පැමිණෙන බව දැනගන්න. මන්ද, මිනිස්සු තමුන්ටම ප්‍රේම කරන, මුදලට ප්‍රේම කරන,





*මේවා ‘කටයුතු කිරීමට අසීරු අන්තරාදායක කාලවල්ය‘*

*නමුත් ඊළඟට “අවසානය පැමිණෙන්නේය”*

පුරසාරම් කියන, උඩඟු, දේවඅපහාස කරන, දෙමාපියන්ට අකීකරු වන, ස්තුතිවන්ත නොවන, පක්ෂපාතීත්වයක් නැති, ජන්ම ස්නේහය නැති, කිසි කාරණයකදී එකඟ නොවන, නින්දා කරන, ආත්ම දමනය නැති, දරුණු, යහපතට ප්‍රේම නොකරන, අනුන්ව පාවා දෙන, හිතුවක්කාර, අහංකාර, දෙවිට ප්‍රේම කරනවාට වඩා සැප සෙල්ලමට ප්‍රේම කරන අය වන්නෝය. යම් ආකාරයක දේවභක්තියක් තිබෙන බව පෙන්නුවත් එහි බලයට අනුව ජීවත් නොවන්නෝය. මොවුන්ගෙන් අහක් වෙන්න.”—2 තිමෝති 3:1-5.

මේ දේවල් මිනිස් ඉතිහාසයේ මීට පෙරත් සිදු වී තිබේයයි ඇතැමෙක් තර්ක කරන්නට පුළුවන. එහෙත් සත්‍යය නම් මේ තරම් පරිමාණයකින් මීට පෙර මේවා සිදු නොවීමයි. ඉතිහාසඥයන් සහ විචාරකයන් පවසන්නාක් මෙන්, 1914න් පසුව අද්දුටුවාක් මෙන් කාලයක් කිසිදා මිහිපිට තිබී නොමැත. (7වන පිටුව බලන්න.) දුක් ගාවිනාවන් පෙර නොවූ විරූ ලෙස වැඩි වී තිබේ. අන්තිම දවස් ගැන ක්‍රිස්තුස් දුන් ලකුණේ තවත් අංගයක් වශයෙන් මෙම සාධකයද සැලකිල්ලට ගත යුතුයි. එනම්, ක්‍රිස්තුස්ගේ පැමිණ සිටීම හා රාජ්‍යය පිළිබඳව ලොව පුරා ප්‍රකාශ කිරීමක් මෙතරම් පුළුල් ලෙස ඉතිහාසයේ මීට පෙර කවරදාකවත් කර නැත. දේශනා කිරීම හේතුවෙන් යෙහෝවාගේ සාක්ෂිකරුවන් මෙතරම් පීඩාවලට කවදාවත් මුහුණ දී නැත. ඔවුන්ගෙන් සිය ගණනක් නාට්සි ගාල් කඳවුරුවල ඝාතනය කරනු ලැබූහ. අද දක්වාම ඇතැම් ප්‍රදේශවල යෙහෝවාගේ සාක්ෂිකරුවන්ව තහනම් කර තිබේ. තවත් ප්‍රදේශවල ඔවුන්ව අත්අඩංගුවට ගනු ලැබ, සිරගත කරනු ලැබ, වධ දෙනු ලැබ හා මර-



ණයට පත් කරනු ලැබ තිබේ. මේ සියල්ලම යේසුස් දුන් ලකුණේ කොටසක්ය.

එළිදරව් 11:18හි පුරෝකථනය කර ඇති පරිදි, යෙහෝවාගේ විශ්වාසවන්ත සාක්ෂිකරුවන්ට එරෙහිව ‘ජාතීහු උදහස් වී සිටිති.’ තවද මින් ඇඟවෙන්නේ යෙහෝවා ‘තමාගේම උදහස’ එම ජාතීන් කෙරෙහි ප්‍රකාශ කරනු ඇති බවයි. දෙවි ‘පොළොව විනාශ කරන්නවුන් විනාශ කරන’ බවද එම ශුද්ධ ලියවිලි පාඨයේම පවසයි. ජීවීන් රක්ෂා කිරීමට පොළොවට ඇති හැකියාවට මෙතරම් තර්ජන එල්ල වී ඇති කාලයක් මීට පෙර මිනිස් ඉතිහාසයේ කවර කලකවත් තිබී නැත. කෙසේවෙතත්, දැන් එය වෙනස් වී තිබේ! මිනිසා මේ ලෙසින් දිගටම පොළොව දූෂණය කළොත්, එය ජීවත් විය නොහැකි තැනක් බවට පත් වේයයි බොහෝ විද්‍යාඥයන් අනතුරු අඟවා තිබේ. එහෙත්, යෙහෝවා එය ‘සෑදුවේ වාසය පිණිසය.’ තවද පොළොව දූෂණය කරන්නන් මුළුමනින්ම එය විනාශ කිරීමට පෙරාතුව ඔහු ඔවුන්ව තුරන් කර දමනවා ඇත.—යෙසායා 45:18.

## රාජ්‍යය යටතේ මිහිපිට ආශීර්වාද

ගැලවීම ලබන සියල්ලන් ස්වර්ගයට යනවායයි සිතන, එමෙන්ම බයිබලය ගැන විශ්වාස කරන බොහෝදෙනෙකුට, දෙවිගේ රාජ්‍යය යටතේ පොළොව මත යටත්වැසියන් ලෙස ජීවත් වීම අමුතු අදහසක් වන්නට ඉඩ තිබේ. නමුත් බයිබලයේ පෙන්වන්නේ සීමිත සංඛ්‍යාවක් පමණක් ස්වර්ගයට යන බවත්, අසීමිත සංඛ්‍යාවකින් සමන්විත මහත් සමූහයක් පොළොව මත පාරාදීසයක ජීවත්




නෙදර්ලන්තය


නායිජීරියාව

වන බවත්ය. (ගීතාවලිය 37:11, 29; එළිදරව් 7:9; 14:1-5) දානියෙල් නමැති බයිබල් පොතේ පෙන්නුම් කරන අනාවැකියේ පෙන්වන්නාක් මෙන් ක්‍රිස්තුස් යටතේ පවතින දෙවිගේ රාජ්‍යය පොළොව පූර්ණ කර එය පාලනය කරනවා ඇත.

යෙහෝවාගේ පරමාධිපත්‍යය සමාන කර තිබෙන්නේ විශාල කන්දකටය. ක්‍රිස්තුස්ගේ රාජ්‍යය ඉන් කැපූ ගලක් ලෙසට පෙන්වා තිබේ. එය, පොළොවේ බලවත් ජාතීන්ව නියෝජනය කෙරෙන රූපයකට පහර දී විනාශ කරන අතර, “රූපයට ගැසූ ගලද මහත් කන්දක් වී මුළු පොළොව එයින් පිරුණේය.” මෙම අනාවැකිය තවදුරටත් මෙසේ කියයි. “ඒ රජුන්ගේ දවස්වලදී ස්වර්ගයේ දෙවි කිසි කලක නැති නොවන්නාවූ රාජ්‍යයක් පිහිටුවන්නේය. ඒකේ ආණ්ඩුව අන් සෙනඟකට අත්හරිනු නොලබන්නේය. ඒක ඒ සියලු රාජ්‍යවල් පොඩි කර නැති කරන්නේය. එයද සදාකාලේටම පවතින්නේය.” —දානියෙල් 2:34, 35, 44, 45, පැ.අ.

යෙහෝවාගේ සාක්ෂිකරුවෝ මේ රාජ්‍යය ගැන සහ පිරිසිදු කරන ලද සුන්දර පොළොවක් මත සදාකාල ජීවනය ගැන ශුද්ධ ලියවිල්ල මත පදනම් බලාපොරොත්තුව ගැන ඔබට කීමට ඉමහත් සතුටින් සිටිති. දැන් ජීවත් වන මිලියන ගණනක් දෙනාට සහ සොහොන්වල දැනට සැතපී සිටින මිලියන ගණන් මළවුන්ට එහි සදාකල් වාසය කිරීමේ ප්‍රස්තාව උදා වෙනවා ඇත. එමෙන්ම, යෙහෝවා පොළොව මවා පළමු මිනිස් යුවළව එහි පදිංචි කිරීමට හේතු පාදක වූ මුල් අරමුණ ක්‍රිස්තුස් යේසුස්ගේ දහස් අවුරුදු පාලනය යටතේ ඉෂ්ට වෙනවා ඇත. මෙම භූමික පාරාදීසය කිසිවිටෙකත් නිරස එකක් නොවනු ඇත. ඒදන් උයනේ වැඩකටයුතු කිරීමට ආදම්ට පවරනු ලැබුවාක් මෙන්ම, පොළොව සහ ඒ මත වූ ශාක සහ සත්ව ජීවිත රැකබලා ගැනීමේ උනන්දුමත් ව්‍යාපෘතීන් මිනිස් වර්ගයාට තිබෙනු ඇත. ඔවුන් “තමුන්ගේ අත් වැඩ බොහෝ කල් භුක්ති විඳින්නෝය.”—යෙසායා 65:22, පැ.අ.; උත්පත්ති 2:15.

“ඔබගේ රාජ්‍යය පැමිණේවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද සිදු වේවා” යනුවෙන් යේසුස් ඉගැන්වූ යාච්ඤාවට පිළිතුරු ලැබෙන විට, පොළොවේ ඇති වන තත්වයන් දැක්වීමට ශුද්ධ ලියවිලි පද බොහොමයක් ඉදිරිපත් කළ හැකියි. (මතෙව් 6:10) කෙසේවෙතත්, දැනට මේ පදය ප්‍රමාණවත් වේවි. “ඒ සමඟම, සිංහාසනය කෙරෙන් නික්මුණු මහත් හඬක් මෙසේ කියනවා මට ඇසුණේය: “බලන්න! දෙවිගේ කූඩාරම මිනිසා සමඟය. ඔහු ඔවුන් සමඟ වාසය කරන්නේය, ඔවුහුද ඔහුගේ සෙනඟ වන්නෝය. දෙවිම ඔවුන් සමඟ සිටින්නේය. තවද, ඔහු ඔවුන්ගේ ඇස්වලින් සෑම කඳුලක්ම පිස දමන්නේය, මරණයද තවත් නොවන්නේය, වැලපීමද හැඬීමද වේදනාවද තවත් නොවන්නේය. පළමු දේවල් පහව ගියේය.” සිංහාසනය මත ඉඳගෙන සිටින තැනැත්තා මෙසේ කීවේය: “බලන්න! මම සියල්ල අලුතෙන් සාදන්නෙමි.” තවදුරටත් ඔහු කතා කොට: “ලියන්න. මන්ද මේ වචන විශ්වාසවන්තය, සැබෑය” කියාද කීවේය.”—එළිදරව් 21:3-5.